# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2398/13 - 2024 අගෝස්තු මස 20 වැනි අඟහරුවාදා - 2024.08.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.- 5/1986 (II)

### 1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනත

1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනතේ 6 වන වගන්තිය සහ 8 වන වගන්තිය සමග කියවිය යුතු 28 වන වගන්තිය යටතේ කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**මහින්ද අමරවීර,**
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය.

2024 ජූලි මස 25 වැනි දින,
බත්තරමුල්ලේ දී ය.

නියෝග

2010 දෙසැම්බර් මස 06 වන දින අංක 1,683/5 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2010 අංක 1 දරන පොහොර (ආනයනය කිරීමේ, නිෂ්පාදනය කිරීමේ සහ සකස්කිරීමේ) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

1. එහි 3 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"3. බලපත්‍රයක් සඳහා වන ඉල්ලීමක් සම්බන්ධයෙන් පනතේ 6 වන වගන්තිය යටතේ ගෙවිය යුතු ගාස්තුව පහත දැක්වෙන පරිදි විය යුතු ය :-

| | | | |
|---|---|---|---|
| (අ) | පොහොර ආනයනය කිරීම සඳහා වන බලපත්‍රයක් | - | රු. 150,000.00 |
| (ආ) | කාබනික නොවන පොහොර නිෂ්පාදනය කිරීම සඳහා වන බලපත්‍රයක් | - | රු. 150,000.00 |

1A - PG 6832 — 504 (2024/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

| | | |
|---|---|---|
| (ඇ) | කාබනික හෝ පරිසර හිතකාමී පොහොර නිෂ්පාදනය කිරීම සඳහා වන බලපත්‍රයක් | - රු. 20,000.00 |
| (ඈ) | පොහොර සකස් කිරීම සඳහා වන බලපත්‍රයක් | - රු. 150,000.00 |

එසේ වුව ද, ස්වකීය පරිභෝජනය සඳහා කාබනික හෝ පරිසර හිතකාමී පොහොර නිෂ්පාදනය කරනු ලබන තැනැත්තෙකුට පනතේ 6 වන වගන්තියේ විධිවිධාන යටතේ වන බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවිය යුතු ය."; සහ

2. එහි 4 වන නියෝගය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"4. බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන ඉල්ලීමක් සම්බන්ධයෙන් පනතේ 8 වන වගන්තිය යටතේ ගෙවිය යුතු ගාස්තුව පහත දැක්වෙන පරිදි විය යුතු ය :-

| | | |
|---|---|---|
| (අ) | පොහොර ආනයනය කිරීම සඳහා වන බලපත්‍රයක් | - රු. 100,000.00 |
| (ආ) | කාබනික නොවන පොහොර නිෂ්පාදනය කිරීම සඳහා වන බලපත්‍රයක් | - රු. 100,000.00 |
| (ඇ) | කාබනික හෝ පරිසර හිතකාමී පොහොර නිෂ්පාදනය කිරීම සඳහා වන බලපත්‍රයක් | - රු. 15,000.00 |
| (ඈ) | පොහොර සකස් කිරීම සඳහා වන බලපත්‍රයක් | - රු. 100,000.00,". |

EOG 08 - 0240